## 18. ශීර්ෂය 18 - පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය

-----------------------------------------------------------------------------------------------------------------------------------

### 18.1 විගණන විෂය පථය

--------------------

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 14 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 18.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 18.3 විගණන නිරීක්ෂණය

---------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 18.4 සිට 18.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

--------------------

වැය විෂයයන් 01 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.76,328 ක් වූ ඉතිරිය එම වැය විෂයයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක ප්‍රමාණයක් වී තිබුණි.

## 18.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-------------------------------------

### 18.4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 18.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීමට පමණක් කටයුතු කර තිබුණි.

## 18.5 බේරුම් නොකළ බැරකම්

---------------------------

කාර්යාලය විසින් විසර්ජන ගිණුමේ දක්වා තිබුණු 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු බැරකම්වල එකතුව රු. 107,531 ක් විය. මෙම බැරකම්වලට අමතරව රු.1,030,862 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

## 18.6 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | XXI පරිච්ඡේදයේ 2 හා 3 වගන්ති | | 90,000 | ආයතන සංග්‍රහය අනුව නිල ඇඳුම් හිමි නිලධාරින්ට අමතරව කාර්යාලයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් 15 දෙනෙකු වෙතද නිල ඇඳුම් දීමනා ගෙවා තිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) | 2013 අප්‍රේල් 22 දිනැති අංක 05/2013 දරන චක්‍රලේඛයේ 02 (ආ) ඡේදය | 36,000 | චක්‍රලේඛ විධිවිධාන අනුව හිමි නිළ ඇඳුම් දීමනාව ඉක්මවා නිල ඇඳුම් දීමනා ගෙවා තිබුණි. |
| | (ii) | 2009 ජූනි 17 දිනැති අංක 09/2009(i) චක්‍රලේඛයේ 2 (1) ඡේදය | - | නිලධාරින් 04 දෙනෙකු පැමිණීම හා පිටවීම, කිසිදු ලේඛනයක අත්සන් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 02(iv) ඡෙදය | - | රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී ප.ව. 6.30 න් පසු සේවය කිරීම වෙනුවෙන් දිනකට ගෙවනු ලබන රු.750 ක දීමනාව, පැමිණීමේ ලේඛනය මගින් හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් හෝ පැමිණීම හා පිටවීම සනාථ නොකළ නිලධාරීන් හතර දෙනෙකුට ගෙවා තිබුණි. |
| (iv) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | - | ආයතනයේ සිටින සේවක සංඛ්‍යාව ගැන නොසළකා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**18.7** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------

පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී සේවයේ යෙදෙන නිලධාරීන්ට ප්‍රවාහන දුෂ්කරතා සැලකිල්ලට ගෙන ගෙවන ලද දිනකට රු. 750 ක දීමනාව නිල වාහන හිමි නිලධාරීන්ටද ගෙවා තිබුණි.

## 18.8 අවිධිමත් ගනුදෙනු

----------------------

1953 අංක 9 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනතේ 4 වන වගන්තියට පටහැනිව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව අවස්ථා 4 කදී අමතර වැටුප් වර්ධක 10 ක් නිලධාරීන් සඳහා ලබා දී තිබුණි.

**18.9 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 09 | 08 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 15 | 11 | 04 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 16 | 01 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | **එකතුව** | **43** | **38** | **06** | **01** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 06 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අනුමත සේවක සංඛ්‍යාවට අමතරව විශ්‍රාමික නිලධාරියකු අනියම් පදනම මත සේවයේ යොදවා තිබුණි.